## පළමුවන කියැවීම

ඉසයියස් 62:1-5

ඉසයියස් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් ගත් පාඨයකි.

**ඔබේ දෙවියන් වහන්සේ ඔබ කෙරෙහි ප්‍රීති වන සේක.**

මම සියොන් උදෙසාත්, ජෙරුසලම උදෙසාත් නිහඬ ව නොසිටින්නෙමි. එහි දැහැමි බව දීපකයක් මෙන් ද එහි ගැළවීම ඇවිලෙන පහනක් මෙන් ද බැබළෙන තෙක් නිශ්ශබ්ද ව නොසිටින්නෙමි. එම්බා ජෙරුසලම! ජාතීන් නුඹේ දැහැමි බවත්, සියලු රජවරුන් නුඹේ තේජසත් දකිනු ඇත. සමිඳුන්ගේ ම මුඛයෙන් පැවසෙන අලුත් නමක් නුඹට දෙනු ලබන්නේ ය. නුඹ සමිඳුන්ගේ අතෙහි අලංකාර ඔටුන්නක් ද නුඹේ දෙවිඳුන්ගේ අතෙහි රාජ කිරීටයක් ද මෙන් වන්නෙහි ය. නුඹ, 'අත්හරින ලද්ද' කියා ද නුඹේ දේශය 'අත්හරින ලද භාර්යාවක' කියා ද තවත් නොකියනු ලබන්නේ ය. 'මාගේ ප්‍රීතිය' යන අරුත ඇති 'හෙප්ශිබා' නුඹේ අලුත් නම වන්නේ ය. සමිඳාණන් නුඹ කෙරෙහි ප්‍රසන්න බැවින්, නුඹේ දේශය 'ප්‍රීති කරන ගීය' යන අරුත ඇති 'බෙයූලා' කියා කියනු ලබන්නේ ය. එතුමාණෝ නුඹේ දේශය සරණ කොට ගන්න සේක. තරුණයෙකු කන්‍යාවක සරණ කොට ගන්න සේ නුඹේ පුත්‍රයෝ නුඹ සරණ කොට ගන්නෝ ය. මනාලයා මනාලිය කෙරෙහි ප්‍රීති වන්නාක් මෙන් නුඹේ දෙවිඳාණෝ නුඹ ගැන ප්‍රීති ප්‍රමෝද වන සේක.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 96:1-3, 7-10

පිළිතුර: ජනතාවන් අතර සමිඳුන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න.

ගීය: සමිඳුන් හට නව ගීයක් ගයන්න; පොළෝ වැසි සියල්ලෙනි, සමිඳුන් හට ගී ගයන්න. සමිඳුන් හට ගී ගයා, එතුමන්ගේ නාමයට ආසිරි පතන්න; එතුමන්ගේ ගැළවීමේ ශුභාරංචිය දිනෙන් දින ප්‍රකාශ කරන්න.

විජාතීන් අතර එතුමන්ගේ මහිමය ප්‍රකාශ කරන්න; ජනතාවන් අතර එතුමන්ගේ ප්‍රබල ක්‍රියා පවසන්න. සකල ජනයෙනි, සමිඳුන් පසසන්න; ගෞරවය ද බලය ද සමිඳුන් හට පිරිනමන්න.

සමිඳුන් නමට හිමි ගෞරවය එතුමන් හට පිරිනමන්න; පඬුරක් රැගෙන එතුමන් ඉදිරියට එන්න. සමිඳුන් අබිමුව වැඳ වැටෙන්න; ලෝ වැසි සියල්ලෙනි, එතුමන් අබිමුව බියෙන් ඇලළී සිටින්න.

විජාතීන් අතර මෙසේ පවසන්න: "සමිඳාණෝ රජකම් කරන සේක; නොසැලෙන ලෙස ලෝකය පිහිටා ඇත; එතුමාණෝ සාධාරණ ලෙස ජනතාවන් විනිශ්චය කරන සේක.

## දෙවන කියැවීම

1 කොරින්ති 12:4-11

ශුද්ධ වූ පාවලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටාගත් කොටසකි.

**විවිධාකාර දීමනා එකම ශුද්ධාත්මයාණන්ගෙන් ලැබේ.**

විවිධාකාර දීමනා ඇතත්, සිටින්නේ එක ම ශුද්ධාත්මයාණෝ ය. විවිධාකාර සේවා ඇතත්, සිටින්නේ එක ම ස්වාමින් වහන්සේ ය. විවිධාකාර දේව බල ක්‍රියා කරතත්, සිටින්නේ සියල්ලන් තුළ ක්‍රියා කරන එක ම දෙවියන් වහන්සේ ය. අන්‍යොන්‍ය යහපත සඳහා එකිනෙකාට ආත්මයාණන්ගේ ප්‍රකාශවීමක් දී ඇත. කෙනෙකුට ආත්මයාණන් මගින් උවදෙස් දීමේ ප්‍රඥාව ද, තවත් කෙනෙකුට එම ආත්මයාණන් මගින් ම ධර්මය පහදා දීමේ ඥානය ද දී ඇත. අන් කෙනෙකුට

ආත්මයාණන් තුළ විශ්වාසය ද, එම ආත්මයාණන් තුළ තවත් කෙනෙකුට සුව කිරීමේ වරම ද දී ඇත. තවත් කෙනෙකුට හාස්කම් කිරීමේ බලය ද, තවත් කෙනෙකුට දිවැසි වැකි කීමේ බලය ද, තවත් කෙනෙකුට ආත්ම විමසීමේ හැකියාව ද තවත් කෙනෙකුට අන් භාෂාවලින් කතා කිරීමේ පුළුවන්කම ද තවත් කෙනෙකුට එය පහදා දීමේ ශක්තිය ද දී ඇත. මේ සියලු දීමනා, තමන් කැමැති පරිදි, වෙන් වෙන් වශයෙන් එකිනෙකාට බෙදා දෙන්නේ එක ම ආත්මයාණන් වහන්සේ ය.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**සාධුකාරය** ලූක් 19:38

ආලේලූයා! ආලේලූයා!
සමිඳුන් නමින් වඩනා රජුට ආසිරි වේවා!
ස්වර්ගයේ සාමය ද අති උසස් තන්හි මහිමය ද වේවා!
ආලේලූයා!

**ශුද්ධවූ සුවිශේෂය** ජුවාම් 2:1-11

සුවිශේෂක ජුවාම් තුමන් විසින් ලියන ලද දේව වාක්‍යය නම් මෙසේය.

**ගලීලයේ කානා නුවර ජේසුස් ස්වාමින් වහන්සේ මේ පළමු ප්‍රාතිහාර්යය සිදු කළ සේක.**

තුන් වන දවසෙහි, ගලීලයේ කානාහි විවාහ මංගල්‍යයක් විය. ජේසුස් වහන්සේගේ මෑණියෝ ද එහි සිටියා හ. සිය ශ්‍රාවකයන් සමඟ ජේසුස් වහන්සේද මංගල්‍යයට කැඳවනු ලැබූ සේක. මිදියුස හිඟ වූ විට, ජේසුස් වහන්සේගේ මෑණියෝ, "මිදියුස නැතැයි" උන්වහන්සේට කීහ. ජේසුස් වහන්සේද කතා කොට, "ස්ත්‍රීය, ඔබත් මාත් මේ ගැන කරදර වෙන්නේ කුමට ද? මාගේ මොහොත තවම පැමිණ නැතැ" යි වදාළ සේක. උන්වහන්සේගේ මෑණියෝ මෙහෙකරුවන් අමතා, 'මෙතුමාණන් ඔබට කියන කොයි දෙයක් වුව ද කරන්නැ යි' කීහ. ජුදෙව්වවරුන්ගේ පවිත්‍ර වීමේ වත්පිළිවෙත් සඳහා ලීටර් සියයක් පමණ අල්ලන ගල් භාජන සයක් එහි තබා තිබිණි. "භාජනවලට වතුර පුරවන්නැ" යි ජේසුස් වහන්සේ සේවකයන්ට වදාළ සේක. ඔව්හු ද ඒවා ගැටිය දක්වාම පිරෙව්වෝ ය. "දැන් මෙයින් ටිකක් සංවිධායක තැන වෙත ගෙන යන්නැ" යි උන්වහන්සේ ඔවුන්ට වදාළ සේක. ඔව්හු එය ගෙන ගියහ. සංවිධායක තැන මිදි යුස බවට හැරුණු වතුර ගෙන රස බැලීය. එය කෙසේ ලැබිණිදැ යි වතුර ගෙනා සේවකයන් දැන සිටි නමුත්, ඔහු නොදත්තේය. එබැවින් ඔහු මනාලයා කැඳවා, "හැම කෙනෙක්ම පළමුකොට හොඳ මිදි යුසෙන් සංග්‍රහ කරති. කවුරුනුත් සෑහෙන තරමට පානය කල පසු බාල මිදියුසයෙන් සංග්‍රහ කරති. එහෙත්, ඔබ මේ වනතුරු හොඳ මිදියුස තබාගෙන සිටියෙහි ය" යි ඔහුට කීය. මේ වනාහි ජේසුස් වහන්සේ කළ දේව බල ප්‍රකාශ වලින් පළමු වැන්නය. එය සිදු කරන ලද්දේ ගලීලයේ කානාහිදී ය. එසේ කිරීමෙන් උන්වහන්සේ සිය තේජශ්‍රීය ප්‍රකාශ කළ සේක. ශ්‍රාවකයෝ ද උන්වහන්සේ අදහා ගත්හ. ඉන්පසු උන්වහන්සේ සිය මෑණියන් ද සොහොයුරන් ද ශ්‍රාවකයන් ද සමඟ කපර්ණවුමට වැඩිය සේක. එහෙත්, ඔව්හු එහි වැඩි කලක් නොසිටියහ.

සුවිශේෂ වාක්‍යය එසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.